පේරාදෙණිය විශ්වවිද්‍යාලය
பேராதனைப் பல்கலைக்கழகம்
UNIVERSITY OF PERADENIYA

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
தொடர் தொலைக்கல்வி நிலையம்
CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි (බාහිර) පරීක්ෂණය 2021
பொதுக்கலைத் தேர்வு (வெளிவாரி)- 2021
GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) 2021

**ඉතිහාසය I ( HG I )**
**ක්‍රි.ව. 320 දක්වා උතුරු ඉන්දියාවේ ඉතිහාසය**

කාලය පැය 03යි.

යටත් පිරිසෙයින් **එක්** කොටසකින් **එක්** ප්‍රශ්නය බැගින් තෝරා ගෙන ප්‍රශ්න **හතරකට** (4 ) පමණක් පිළිතුරු සපයන්න.

සුදුසු තන්හි ඔබේ පිළිතුර දළ සිතියම් මඟින් පහදන්න.

නොපැහැදිලි අත් අකුරුවලට ලකුණු කපාහරිනු ලැබේ.

මෙම ප්‍රශ්න පත්‍රයෙහි අඩංගු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **දොළස** (12) කි.

---

## I කොටස

1. හරප්පා ශිෂ්ටාචාරයේ ප්‍රධාන නාගරීකරණ ලක්ෂණ පිළිබඳ සටහනක් ලියන්න.
2. හරප්පා සභ්‍යත්වය බිඳවැටීමට තුඩු දුන් සාධක පරීක්ෂා කරන්න.
3. පුරාතන ඉන්දියාවේ ඉතිහාසය හැදෑරීමෙහිලා වෛදික සාහිත්‍යයට හිමිවන වැදගත්කම ප්‍රමාණ කරන්න.
4. පශ්චාද් වෛදික යුගයේ පැවති දේශපාලන තත්ත්වය සාකච්ඡා කරන්න.

## II කොටස

5. අධිරාජ්‍ය බලයක් ලෙසින් මගධයේ නැගීමට දායක වූ සාධක ප්‍රමාණ කරන්න.
6. කෞටිල්‍ය අර්ථශාස්ත්‍රයේ විස්තර කෙරෙන රාජ්‍යයේ දේශපාලන න්‍යාය සාකච්ඡා කරන්න.
7. මෞර්ය සමයේදී විදේශ ලෝකය සමඟ පැවැත්වූ වාණිජ හා සංස්කෘතික සබඳතා පිළිබඳ විවේචනාත්මක සටහනක් ලියන්න.
8. "අශෝකගේ ධර්ම ප්‍රතිපත්තිය වූ කලී හුදෙක් අධිරාජ්‍ය මත රාජකීය අධිකාරිය තහවුරු කරනු සඳහා යොදාගන්නා ලද උපක්‍රමයේ එක් අංශයක් පමණි." පැහැදිලි කරන්න.

## III කොටස

9. සමකාලීන අවධියේ ඉතිහාසය හැදෑරීම සඳහා ඉන්දු-ග්‍රීක කාසිවලට හිමිවන වැදගත්කම ප්‍රමාණ කරන්න.

10. ඉන්දියාව තුළ කුෂාණ රාජ්‍ය බල ව්‍යාප්තියේ ප්‍රධාන අවස්ථා සාකච්ඡා කරන්න.

11. රුද්‍රදාමන්ගේ ජුනාගාර්ධ් හා කාරවේලගේ හත්පීගුම්ඵා අභිලේඛනවල ඓතිහාසික වැදගත්කම පරීක්ෂා කරන්න.

12. ශක-ක්ෂත්‍රප (ක්ෂහාරත-ක්ෂත්‍රප) යුගයේ දේශපාලන කටයුතුවල ප්‍රධාන ලක්ෂණ සැකෙවින් ගෙනහැර දක්වන්න.